# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය
## බෞද්ධ අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය
## ශ්‍රී බු.ව.2565 / 2021

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් ප්‍රධාන අංශ 05ක් යටතේ සංවිධානය කරනු ලබන බෞද්ධ අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රදානය 2021 වර්ෂයේ සිට ආරම්භ කරන ධර්ම දානමය ක්‍රියාවලියකි. උතුම් මානව ගුණය හරවත්ව අවබෝධ කරමින් මානව සංවර්ධනයේ පරමාර්ථ ඉටු කරන සිසු පරපුරක් බිහි කිරීමේ ශක්තීන් ආමන්ත්‍රණය කෙරෙන මෙම වැඩ සටහන දැයේ දූ දරුවන් උදෙසා සිදු කරන අධ්‍යාපනික සත්කාරයකි.

මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය කොටස් 5 කින් සමන්විත වේ.

| | අංශය | පාසල් ශ්‍රේණිය | පාරිවේණික හා විද්‍යායතන | විශ්වවිද්‍යාල උ.අ.ආයතන | ශිෂ්‍යත්ව මුදල |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රාථමික අංශය | 5 ශ්‍රේණියෙන් පහළ | | | රු.750.00 |
| 02 | කණිෂ්ඨ අංශය | 6 සහ 7 ශ්‍රේණි | 1 සහ 2 වසර | | රු.1000.00 |
| 03 | ජ්‍යෙෂ්ඨ අංශය ( සාමාන්‍ය පෙළ) | 10 සහ 11 ශ්‍රේණි | 4 සහ 5 වසර | | රු.1500.00 |
| 04 | ජ්‍යෙෂ්ඨ අංශය ( උසස් පෙළ) | 12 සහ 13 ශ්‍රේණි | 12 සහ 13 වසර | | රු.2500.00 |
| 05 | විශ්වවිද්‍යාල අංශ /උසස් අධ්‍යාපන ආයතනයන්හි (අභ්‍යන්තර) | | ප්‍රාචීන අවසාන (වසර 02) | දෙවන හා තෙවන වසර | රු.3500.00 |

1) ඉහත සඳහන් ශිෂ්‍යත්වයක් සඳහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන්නේ රජයට අයත් පාසල්, පිරිවෙන් සහ විද්‍යායතන,විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි දැනට ඉගෙනුම ලබන අභ්‍යන්තර ශිෂ්‍ය ශිෂ්‍යාවන්, භික්ෂූන් වහන්සේලා සහ මෙහෙණින් වහන්සේලා පමණි.

2) 2021 දෙසැම්බර් මස සිට ඉදිරියට වර්ෂ දෙකක කාලයක් සඳහා මෙම ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ.

3) අප වෙත ලැබෙන අයදුම්පත්‍ර සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟින් පත් කරනු ලබන විශේෂ අනු කමිටුවක් මඟින් පරීක්ෂා කර බලා වඩාත් සුදුසු අයදුම්පත්‍ර පමණක් තෝරාගනු ලැබේ.

4) ශිෂ්‍යත්වයක් අපේක්ෂා කරන මෙහි සඳහන් සුදුසුකම් සහිත අයෙකුට අප සම්මේලනයෙන් නිකුත් කරනු ලබන ශිෂ්‍යත්ව අයදුම්පත්‍රයක් නිසි පරිදි පුරවා ගරු සභාපති, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, අංක 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලිපිනයට අතින් හෝ තැපැල් මඟින් ලැබෙන්නට සැලැස්විය හැකි වේ. ඔබ අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළින් “බෞද්ධ අධ්‍යාපන ශිෂ්‍යත්ව 2021” යන්න සඳහන් කළ යුතු වේ.

5) ඔබ ශිෂ්‍යත්වලාභියෙකු වීමෙන් පසු පාසල/ පිරිවෙන හෝ විද්‍යායතනය/ විශ්වවිද්‍යාලයක ශිෂ්‍යභාවය හිමිව පවතින කාලය තුලදී පමණක් ශිෂ්‍යත්ව ප්‍රදානය ලබා ගැනීමට සුදුසුකම් හිමිවේ.

6) සියළුම ගෙවීම් චෙක්පත් මඟින් සිදු කරනු ලබන අතර අදාල ශිෂ්‍යත්වලාභියාගේ නමට පමණක් එම පරිත්‍යාගය පිරිනමනු ලබයි.

7) සෑම ශිෂ්‍යත්වලාභියෙකුම පාසල් වාරය හෝ අධ්‍යයන වාරය අවසානයේ හෝ මාස 04කට වරක් තමන් එම කාලය තුළදී පන්තිවලට සහභාගී වීම,අධ්‍යයන කටයුතු නිසියාකාරව ඉටු කිරීම හා විනයානුකූලව හැසිරීම පිළිබඳ වූ පන්තිභාර ගුරුවරයාගේ සහ විදුහල්පතිවරයාගේ අත්සනින් යුත් සහතිකයක් සම්මේලනයේ ගරු සභාපතිතුමාට එවිය යුතුය. පාරිවේණික හා විද්‍යායතන අයදුම්කරුවන් පරිවේණාධිපති වහන්සේගෙන් ද, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් , උසස් අධ්‍යාපන ආයතන අදාල අධ්‍යනාංශ ප්‍රධානියාගෙන් ද එම සහතිකය ලබාගෙන අප වෙත එවිය යුතුය.මෙම සහතිකය මත ශිෂ්‍යත්ව ප්‍රදානය අදාල කාලසීමා සඳහා ප්‍රදානය කෙරේ.

8) මෙම ශිෂ්‍යයත්ව ප්‍රදානය පිළිබඳව අවසන් තීරණය ගනු ලබන්නේ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය මඟිනි.කිසියම් අවස්ථාවක අසත්‍ය තොරතුරු ඇතුළත් කර ඇති බවට සම්මේලනයට පිළිගත හැකි කරුණු ඇත්නම් අයදුම්පත්‍රය අනුමත වීමෙන් පසුව වුවද ප්‍රතික්ෂේප කිරීමට සම්මේලනයට බලය ඇත.

9) මෙම අයදුම්පත්‍රයෙහි අංක 19 යටතේ ඇති අයදුම්කරුගේ පවුලේ විස්තරයට අමතරව පවුලේ වාර්ෂික ආදායම් තත්වය හා දූ දරුවන්ගේ විස්තරය ඇතුලත් ලිපියක් ද මෙම අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර එය මව,පියා හෝ භාරකරු සහතික කර විය යුතු වේ. තවද එක් පවුලකින් ශිෂ්‍යත්ව ඉල්ලුම්ලාභීන් කිහිප දෙනෙක් සිටි නම් එහිදී ශිෂ්‍යත්ව ලබාගැනීමට සුදුසුකම් ලැබූ එක් අයෙකුට පමණක් ශිෂ්‍යත්ව ලබාදෙනු ඇත

10) සියළුම අයදුම්කරුවන් පහත සඳහන් සහතික පිටපත් අයදුම්පත්‍රය සමඟ එවිය යුතු වේ.

(1) හැඳුනුම්පතෙහි පිටපතක් (2) උප්පැන්න සහතික පිටපතක් (3) කණිෂ්ඨ හා ප්‍රාථමික අයදුම්කරුවන් විදුහල්පති සහතික කරන ලද ඡායාරූපයක් (4) 2020 වර්ෂය අවසන් වරට පෙනී සිටි විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ පිටපතක්. (5) අවසන් වරට පෙනී සිටි සාමාන්‍ය පෙළ/ උසස් පෙළ ප්‍රතිඵල ලේඛනයේ පිටපතක්. (6) ඔබ සතුව බැංකු ගිණුමක් පවතින්නේ නම් බැංකුවේ නම, ගිණුම් අංකය, ඔබගේ නම සහ ලිපිනය ඇතුලත් කොටසේ ඡායා පිටපතක්.

11) අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය 2021 දෙසැම්බර් 30 දිනය වන අතර අයදුම්පත්‍ර හා විස්තර කොළඹ 07, බෞද්ධාලෝක මාවත , අංක 380, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලන මූලස්ථාන කාර්යාලයෙන් හෝ අපගේ වෙබ් අඩවිය www.acbc.lk/application වෙත යොමුවීමෙන් ලබා ගත හැක.

වැඩි විස්තර : ගරු සභාපති, ශිෂ්‍යත්ව කමිටුව, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය, 380, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

දු.ක.අංකය : 011 269 1695
077 732 905 (උපේෂ් පෙතියාගොඩ- ගරු සභාපති, ශිෂ්‍යත්ව කමිටුව)

වෙබ් අඩවිය : www.acbc.lk

විද්‍යුත් තැපැල : acbc380@gmail.com